# අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට

2023 වසර අවසාන ඇගයීම

2024 ජූනි

© Verité Research

# අන්තර්ගතය


**අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට** ..... 3

ඇගයීම් ක්‍රමවේදය ..... 3

- **විවෘතභාවය** ..... 3
- **ප්‍රගතිය** ..... 4

**සොයාගැනීම් විස්තරාත්මකව** ..... 7

- වගකීම්භරණය ..... 27

# අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට

**"අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට"** යනු අයවැය කතාවෙහි සඳහන් පොරොන්දු ඉටුකිරීමෙහිලා රජයේ කාර්ය සාධනය වාර්තා කරන ඩැෂ්බෝඩයක් වේ.

2017 වර්ෂයේදී හඳුන්වාදුන් මෙම ඩැෂ්බෝඩය, රජය සිය වාර්ෂික අයවැය කතාවේදී දෙන පොරොන්දු පිළිබඳ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු දීමට උත්සාහ කරයි:

- රජය ක්‍රියාවට නංවන්නේ පවසන දෙය ද?
- රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙය ද?

මෙම ඩැෂ්බෝඩය හරහා ඉහත ප්‍රශ්න වලට පිළිතුරු, ජනතාවට ලබා දීමෙහි අරමුණ වන්නේ,

1. රජයේ අයවැය පොරොන්දු සම්බන්ධව විවෘතභාවය වර්ධනය කිරීම සහ
2. අයවැය පොරොන්දු ඉටුකිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල වගවීම වර්ධනය කිරීමයි

# ඇගයීම් ක්‍රමවේදය

වසරකට දෙවතාවක් යාවත්කාලීන කරන මෙම ඩැෂ්බෝඩය වැය යෝජනා විවෘතභාවය සහ ප්‍රගතිය යන දර්ශක දෙක භාවිතයෙන් ඇගයීමට ලක් කරයි. අර්ධ වාර්ෂික ඇගයීම මඟින් අදාළ වසරේ පළමු මාස හය සඳහා වන වැය යෝජනා වල ප්‍රගතිය සහ විවෘතභාවය ඇගයීම් කෙරේ. වසර අවසාන ඇගයීම, සමස්ථ වසර සඳහාම වැය යෝජනාවල ප්‍රගතිය සහ විවෘතභාවය තක්සේරු කරයි.

2023 වසර අවසාන ඇගයීමේදී, 2023 අයවැය කතාවේදී යෝජනා කරන ලද වියදම් යෝජනා 25ක් සහ ප්‍රතිපත්ති යෝජනා 4ක් ඇගයීමට ලක් කෙරුණි. වියදම් යෝජනා සඳහා ප්‍රතිපාදන සහ ප්‍රමාණාත්මක ප්‍රතිපල තිබුණු අතර ප්‍රතිපත්ති යෝජනා ඉටුකර ඇතිබව තහවුරු කර ගැනීමට නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) අවශ්‍ය විය.

පර්යේෂණ කණ්ඩායම මෙම යෝජනා වලට අදාළ තොරතුරු ප්‍රගාමීව අන්තර්ජාලයට එක් කර ඇත්දැයි පරීක්ෂා කළ අතර, මූලික වශයෙන් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වන පනත හරහා නියෝජිතායතනවල ගොනු කළ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත් වලින් තොරතුරු රැස්කර ගෙන ඇත. 2023 වසර අවසාන ඇගයීම සඳහා මෙම ඉල්ලුම්පත් 2024 ජනවාරි 31 දින ගොනුගත කරන ලදී. වැඩ කරන දින 28ක කාලයක් පුරා නියෝජිතායතන වෙතින් ඇගයීම් සඳහා තොරතුරු භාරගන්නා ලදී. මෙම කාලසීමාවට පසුව ලැබුණු කිසිදු තොරතුරක් ඇගයීම සඳහා සලකා බලනු නොලැබීය.

### විවෘතභාවය

මෙම දර්ශකය රජය විසින් තමන් කුමක් කරන්නේදැයි, පවසන ප්‍රමාණය ඇගයීමකට ලක් කෙරේ. එමගින් එක් එක් යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු රජය විසින් අනාවරණය කිරීමේ මට්ටම මනිනු ලැබේ. කෙටියෙන් ගත් කල මෙම දර්ශකය මගින් විනිවිදභාවය ඇගයීමකට ලක් කෙරේ.

අර්ධ වාර්ෂික ඇගයීමේදී, වසරේ පළමු මාස හය තුල යෝජනාවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු හෙළි කිරීමේ ප්‍රවණතාව ඇසුරෙන් විවෘතභාවය ඇගයීමට ලක් කරනු ලැබේ. වාර්ෂික ඇගයීමේදී, සම්පූර්ණ වසර සඳහා වන වියදම් සහ ප්‍රතිපත්ති යෝජනාවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු හෙළි කිරීමේ ප්‍රවණතාව ඇසුරෙන් විවෘතභාවය ඇගයීමට ලක් කරනු ලැබේ.

ඇගයීම සිදු කරන වේලාවේ ලැබී ඇති තොරතුරු මත පදනම්ව විවෘතභාවය ඇගයෙන අතර එය පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| | |
|---|---|
| ආවෘත | කිසිදු තොරතුරක් නොමැත. |
| සීමිත | ප්‍රගතිය ඇගයීමට තොරතුරු ප්‍රමාණවත් නොමැත. |
| උදාසීන | ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබාගැනීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. |
| සාධනීය | ප්‍රගතිය පිළිබඳ තොරතුරු අදාල කාලය තුල ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිවිය. |
| විවෘත | පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත. |

## ප්‍රගතිය

මෙම දර්ශකය මගින් රජය තමන් කරන්නේ යැයි පවසන දේ, කෙතරම් දුරට ඉටු කරන්නේද යන්න ඇගයීමකට ලක් කරනු ලැබේ. ස්ථාපිත කාල රේඛාවන් සහ සන්ධිස්ථාන මත පදනම්ව යෝජනා සහ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේලා රජයේ ප්‍රගතිය ඇගයීමට ලක් කරයි.

පසුගිය වසරවල අපගේ අත්දැකීම් මත පදනම්ව, 2023 අවසානය වන විට ප්‍රගතිය නිරීක්ෂණය කරන ප්‍රගති ඇගයීමට අපි නව කාණ්ඩයක් හඳුන්වා දී ඇත. ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු බවට මුදල් අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති නියෝජිතායතන වගකීම් ප්‍රතික්ෂේප කරන යෝජනා වර්ග කිරීමට “අයිතිකරුවෙකු නැත” යන නව කාණ්ඩය භාවිතා වේ.

ලබන වසරේ සිට, ඉදිරි අර්ධ වාර්ශික ඇගයීම් සඳහා වියදම් යෝජනා සඳහා ප්‍රගතිය පහත පරිදි වර්ග කෙරේ.

| | |
|---|---|
| **අයිතිකරුවෙකු නැත** | ජාතික අයවැය දෙපාර්තමේන්තුව (DNB) හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DFP) විසින් හඳුනාගෙන ඇති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය (IA) විසින් පොරොන්දුව ඉටු කිරීම පිළිබඳව ඇති වගකීම ප්‍රතික්ෂේප කර ඇත. |
| හෙළි කර නැත | ජාතික අයවැය දෙපාර්තමේන්තුව (DNB) හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DFP) විසින් හඳුනාගෙන ඇති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය (IA) විසින් පොරොන්දුව ඉටු කිරීම පිළිබඳව ඇති වගකීම ප්‍රතික්ෂේප කළේවත් පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට අදාළ තොරතුරු ලබාදුන්නේවත් නැත හෝ පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත / භාවිත කළ නොහැක. |

| | |
|---|---|
| **කඩ කර ඇත** | පොරොන්දුව අතහැර දමා හෝ කල් දමා ඇති අතර තක්සේරු වර්ෂයේදී එය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොමැත |
| **නොසලකා හැර ඇත** | මෙම පොරොන්දුව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇතත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නැත |
| **මන්දගාමී ප්‍රගතියක් ඇත** | මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇතිමුත් නියමිත කාලයට කටයුතු සිදුකිරීමට අසමත් වී ඇත. |
| **සතුටුදායක ප්‍රගතියක් ඇත** | මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇති අතර අදාළ ඉලක්කය අත්පත් කරගෙන හෝ ඉලක්කය අභිබවා ගොස් ඇත[1] |

2023 අවසානය සඳහා වන ප්‍රගතිය පිළිබඳ අවසාන වසර තක්සේරුව සඳහා වියදම් යෝජනා සඳහා පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | |
|---|---|
| **අයිතිකරුවෙකු නැත** | ජාතික අයවැය දෙපාර්තමේන්තුව (DNB) හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DFP) විසින් හඳුනාගෙන ඇති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය (IA) විසින් පොරොන්දුව ඉටු කිරීම පිළිබඳව ඇති වගකීම ප්‍රතික්ශේප කර ඇත. |
| **හෙළි කර නැත** | ජාතික අයවැය දෙපාර්තමේන්තුව (DNB) හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DFP) විසින් හඳුනාගෙන ඇති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය (IA) විසින් පොරොන්දුව ඉටු කිරීම පිළිබඳව ඇති වගකීම ප්‍රතික්ශේප කළේවත් පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට අදාළ තොරතුරු ලබාදුන්නේවත් නැත හෝ පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත / භාවිත කළ නොහැක. |
| **කඩ කර ඇත** | වසරේ ක්‍රියාකාරී සැලසුමෙන් ඉවත්කර හෝ වසර තුල කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොමැත |
| **දුර්වලයි** | ඉලක්කගත ප්‍රගතියෙන් 33% වඩා අඩු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |
| **අර්ධ සම්පූර්ණයි** | ඉලක්කගත ප්‍රගතියෙන් 33%-66% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. |
| **සැළකිය යුතුයි** | ඉලක්කගත ප්‍රගතියෙන් 66%-80% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |

[1] යෝජනාවක් සතුටුදායක ප්‍රගතියක් ලබා ඇති බවට වර්ගීකරණය කෙරෙනුයේ ජූනි 30 වන දින වන විට අයවැය වර්ෂයේ ඉලක්ක වලින් 90% ක් වත් අදාළ කාලය තුළ නිම කර ඇත්නම් පමණි.

| | | |
|---|---|---|
| | සම්පූර්ණයි | ඉලක්කගත ප්‍රගතියෙන් 80% ඉක්මවූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |

ප්‍රතිපත්ති යෝජනා සඳහා ප්‍රගතිය පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| | | |
|---|---|---|
| | **අයිතිකරුවෙකු නැත** | ජාතික අයවැය දෙපාර්තමේන්තුව (DNB) හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DFP) විසින් හඳුනාගෙන ඇති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය (IA) විසින් පොරොන්දුව ඉටු කිරීම පිළිබඳව ඇති වගකීම ප්‍රතික්ශේප කර ඇත. |
| | හෙළිකර නැත | ජාතික අයවැය දෙපාර්තමේන්තුව (DNB) හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DFP) විසින් හඳුනාගෙන ඇති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය (IA) විසින් පොරොන්දුව ඉටු කිරීම පිළිබඳව ඇති වගකීම ප්‍රතික්ශේප කළේවත් පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට අදාළ තොරතුරු ලබාදුන්නේවත් නැත හෝ පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත / භාවිත කළ නොහැක. |
| | ක්‍රියාත්මක කර නැත | යෝජනාවේ කිසිදු කොටසක් සඳහා අවශ්‍ය නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) ප්‍රකාශයට පත්කර නොමැත. මේ බව අදාල අමාත්‍යාංශය විසින් ලිඛිතව තහවුරු කර ඇත. |
| | අර්ධ සම්පූර්ණයි | යෝජනාවේ ඇතැම් කොටස් සඳහා අවශ්‍ය නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) ප්‍රකාශයට පත්කර ඇත. |
| | සම්පූර්ණයි | ප්‍රතිපත්ති යෝජනාව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර ඇත. යෝජනාවේ සියලුම කොටස් සඳහා අවශ්‍ය නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) ප්‍රකාශයට පත්කර ඇත. තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. |

## සොයාගැනීම් විස්තරාත්මකව

**වියදම් යෝජනා**

| අයවැය ඡේද අංකය සහ යෝජනාව | ප්‍රතිපාදනය (රු. මිලියන) | රජයේ නියෝජිතායතනය | විවෘතභාවය | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 47:<br>සමෘද්ධි ප්‍රතිලාභීන්, වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු රෝගීන්ගේ දීමනා සඳහා ගෙවනු ලබන වැඩි කළ දීමනා අඛණ්ඩව ලබා දීම. | රු. මිලියන 43,000 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය (සමාජ සවිබල ගැන්වීමේ ඒකකය)<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)<br><br>ආබාධිත පුද්ගලයින් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය (NSPD) | **සීමිත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා ප්‍රමාණවත් තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර 2024 මාර්තු 25 වන දින තොරතුරු ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 28කට පසුව, එනම් 2024 මාර්තු 14 දිනැතිව, මෙම තොරතුරු ලිපිය ලැබිණි.<br><br>ලැබුණු ප්‍රතිචාරයේ ‘අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන්’ සහ ‘වකුගඩු රෝගීන්’ සඳහා වන දීමනා පිළිබඳ වැඩසටහන සඳහා මූල්‍ය ඉලක්ක/ සත්‍ය දත්ත ඇතුළත් විය. කෙසේ වෙතත්, වැඩිහිටි සහ සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා දීමනා පිළිබඳ වැඩසටහන පිළිබඳ තොරතුරු ලබා දී නොමැත.<br><br>සපයා ඇති තොරතුරු ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින්, පොරොන්දුවේ විවෘතභාවය “සීමිත” ලෙස වර්ගීකරණය කරන ලදී. | **හෙළිකර නැත**<br><br>1) සමෘද්ධි ප්‍රතිලාභීන්, 2) වැඩිහිටි, 3) ආබාධිත, සහ 4) වකුගඩු රෝගීන් - යන ප්‍රතිලාභීන් කාණ්ඩ හතරක් සඳහා දීමනාවක් ලබාදීමට මෙම මුදල් වෙන්කිරීම සිදු කරන ලදී.<br><br>රුපියල් මිලියන 10,800 (ප්‍රතිපාදනවලින් 25%) සඳහා NSPD වෙතින් ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලැබුණි. මෙම මුදලින් 79%ක් අඩු ආදායම්ලාභී ආබාධිත සහ වකුගඩු රෝගීන් සඳහා දීමනා ලබාදීමට භාවිත කර ඇත.<br><br>ප්‍රතිපාදනවලින් 75%ක් සහ ප්‍රතිලාභීන් කාණ්ඩ දෙකක්: වැඩිහිටි සහ සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වෙන්කරන ලද මුදල් පිළිබඳව කිසිදු තොරතුරක් නොලැබිණි.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීමට තොරතුරු ප්‍රමාණවත් නොවූ බැවින්, එම පොරොන්දුවේ ප්‍රගතිය “හෙළිකර නැත” ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 61:<br>ගංවතුර නිසා හානියට පත් වූ මාර්ග සහ පාළම් ප්‍රතිසංස්කරණය හා ඉදිකිරීම. | රු. මිලියන 2,000 | මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) | **උදාසීන**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා ප්‍රමාණවත් තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 වැනි දින තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට පළමු පිළිතුර 2024 මාර්තු 4 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනුකළ දින සිට දින 21ක් ඇතුළත එනම් 2024 පෙබරවාරි 21 දිනැතිව, පළමු තොරතුරු ලිපිය ලැබිණි. කෙසේ වෙතත්, සමස්ත ප්‍රතිපාදනවලින් 80% කට ආසන්න ප්‍රමාණයක් සඳහා ඉලක්ක සහ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දී නොතිබිණි. | **දුර්වලයි**<br><br>මාර්ග සංවර්ධන අධිකාරියෙන් තොරතුරු ඉල්ලුම්පතට ලැබුණු ප්‍රතිචාරයට අනුව, මුළු ප්‍රතිපාදනය පළාත/කොට්ඨාශ අනුව කාණ්ඩ පහකට බෙදා ඇත: ඉදිකිරීම් අංශය (රුපියල් මිලියන 900), සබරගමුව පළාත (රුපියල් මිලියන 398), මධ්‍යම පළාත (රුපියල් මිලියන 450), ඌව පළාත ( රුපියල් මිලියන 84) සහ දකුණු පළාත (රුපියල් මිලියන 168). පළාත් හතර යටතේ යම් යම් උප ක්‍රියාකාරකම් සඳහා ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දී තිබුණද, ඉදිකිරීම් අංශය යටතේ ප්‍රතිපාදන සඳහා ප්‍රගතිය තක්සේරු කිරීමට තොරතුරු ලබා දී නොදුණි.<br><br>ලද තොරතුරු අනුව පළාත් හතර සඳහා වෙන් කළ රුපියල් මිලියන 1100 න් වැය කර ඇත්තේ මිලියන 86.78 ක් පමණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | 2024 මාර්තු 18 වැනි දින (දින 28 කට පසුව), රුපියල් මිලියන 2,000 ක අයවැය ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 1,100 ක් සඳහා මූල්‍ය ඉලක්ක සහ කාර්ය සාධනය ඇතුළත් දෙවන පිළිතුර ලැබුණි.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු බොහෝ පරිශ්‍රමයකින් (ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 21 කින් පසුව) ලබා ගත් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "උදාසීන" ලෙස වර්ගීකරණය කරන ලදී. | පවතින දත්ත මත පදනම්ව සහ ඉදිකිරීම් අංශය රුපියල් මිලියන 900 ක ප්‍රතිපාදනවලින් කිසිවක් වියදම් කර නැතැයි උපකල්පනය කළහොත්, මෙම පොරොන්දුව අත්කරගෙන ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය 4% කි.<br><br>ඉහත ප්‍රගතිය 33% ට වඩා අඩු බැවින් පොරොන්දුවේ ප්‍රගතිය "දුර්වලයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 49:<br>ළමා පෝෂණය වැඩි කිරීම - ළමා පෝෂණය වැඩි කිරීම සඳහා පවත්නා පෝෂණ අතිරේක වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කිරීම. | රු. මිලියන 500 | සෞඛ්‍ය අමාත්‍යාංශය (MOH) | **උදාසීන**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 මාර්තු 13 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 21කට පසුව, නමුත් දින 28ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු බොහෝ පරිශ්‍රමයකින් (ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 21 කින් පසුව) ලබා ගත් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "උදාසීන" ලෙස වර්ගීකරණය කරන ලදී. | **කඩ කර ඇත**<br><br>තොරතුරු දැනගැනීමේ අයදුම්පත්‍රයට ලද ප්‍රතිචාරයට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ අංශය විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (DNB) 2023 මාර්තු 15 වන දින 'දිස්ත්‍රික්ක හයක හඳුනාගත් උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන අවුරුදු 5ට අඩු ළමුන් සඳහා යෝජනා ක්‍රමයක්' ඇති කිරීම සඳහා අවශ්‍ය මුදල් ඉල්ලුම් කරමින් යෝජනාවක් යවා ඇත. ඉදිරිපත් කළ යෝජනාව තුළ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් නිර්දේශිත ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා උග්‍ර මන්දපෝෂනයෙන් පෙළෙන දරුවන් සිටින තෝරාගත් පවුල් සඳහා වවුචර් ලබා දීම යෝජනා කර තිබිණි.<br><br>කෙසේ වෙතත්, මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට DNB වෙතින් ඉල්ලා සිටි මුදල් ලැබී නොතිබුණි.<br><br>අයවැය වර්ෂය තුළ පොරොන්දුව ක්‍රියාත්මක නොකළ බැවින්, එය " කඩ කර ඇත" ලෙස වර්ගීකරණය කරන ලදී |
| 54:<br>ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩි දියුණු කිරිම:<br>මා ඔය, අත්තනගලු ඔය සහ බෙන්තර ගඟ පදනම් කරගත් වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | රු. මිලියන 500 | වාරිමාර්ග අමාත්‍යාංශය (MOI) | **උදාසීන**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 මාර්තු 12 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 21කට පසුව, නමුත් දින 28ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය. | **දුර්වලයි**<br><br>තොරතුරු දැනගැනීමේ අයදුම්පත්‍රයට ලද ප්‍රතිචාරයට අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 500ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇති අතර, (මුළු ප්‍රතිපාදනය රුපියල් මිලියන 500කි), එයට මහා භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත්තේ රුපියල් මිලියන 83.69ක් පමණි. 2023 දෙසැම්බර් වන විට 17% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගනිමින් වාරිමාර්ග අමාත්‍යාංශය ලැබුණු සියලුම අරමුදල් වියදම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු බොහෝ පරිශ්‍රමයකින් (ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 21 කින් පසුව) ලබා ගත් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "උදාසීන" ලෙස වර්ගීකරණය කරන ලදී. | ලබා දී ඇති තොරතුරු වලට අනුව, 2023 දෙසැම්බර් වන විට ඉලක්කගත 100% භෞතික ප්‍රගතියෙන් 40%ක් ළඟා කරගෙන ඇත.<br><br>ඒ අනුව, අයවැය වර්ෂය තුළ ලබා ඇති සමස්ත ප්‍රගතිය 28% කි.<br><br>ඉහත ප්‍රගතිය 33% ට වඩා අඩු බැවින් පොරොන්දුවේ ප්‍රගතිය "දුර්වලයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 6:<br>විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා නව ආර්ථික කලාප : බස්නාහිර පළාත, වයඹ පළාත, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල නව ආර්ථික කලාප පිහිටුවීම. | රු. මිලියන 300 | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය (MOIP) | **සාධනීය**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 පෙබරවාරි 27 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව, නමුත් දින 21ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි තොරතුරු නියමිත වේලාවට ලබා දුන් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "සාධනීය" ලෙස වර්ගීකරණය කරන ලදී. | **අර්ධ සම්පූර්ණයි**<br><br>ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් දැනට පවතින ආයෝජන ප්‍රවර්ධන/ කාර්මික කලාප දෙකක: (1) බස්නාහිර පළාතේ වගාවත්ත කාර්මික කලාපයේ සහ (2) වයඹ පළාතේ බිංගිරිය ආර්ථික සැකසුම් කලාපයේ, යටිතල පහසුකම් ව්‍යාපෘති දෙකට අදාළ භෞතික හා මූල්‍ය ඉලක්ක සහ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දී ඇත.<br><br>මෙම තොරතුරු අනුව, කලාප දෙකෙහි යටිතල පහසුකම් ව්‍යාපෘති දෙක සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල රුපියල් මිලියන 3,896 කි. මෙයින් රුපියල් මිලියන 300ක් ව්‍යාපෘති දෙක සඳහා වියදම් කර ඇත්තේ මෙසේය: (1) බිංගිරිය ආර්ථික සැකසුම් කලාපයේ ප්‍රවේශ මාර්ගය (රුපියල් මිලියන 68.14), සහ (2) වගාවත්ත කර්මාන්ත කලාපයට විදුලිය සැපයීම (රුපියල් මිලියන 231.86).<br><br>2023 දෙසැම්බර් වන විට, ඉහත කී යටිතල පහසුකම් ව්‍යාපෘති දෙක සඳහා රුපියල් මිලියන 300 ක මුළු ප්‍රතිපාදනය වැය කරමින් 74% ක භෞතික ප්‍රගතියක් සහ 100% මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.<br><br>නමුත්, මෙම ලද තොරතුරු අතර, ත්‍රිකුණාමලයේ සහ හම්බන්තොට යෝජිත අනෙකුත් කලාප දෙක ගැන කිසිදු සඳහනක් නැත.<br><br>ඉහත තොරතුරු අනුව, මෙමෙ පොරොන්දුවේ ප්‍රගතිය, "අර්ධ සම්පූර්ණයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 48: | රු. මිලියන | | **සීමිත** | **හෙළිකර නැත** |

| | | | | |
|---|---|---|---|---|
| කුටුම්භ ව්‍යවසායකයන් ලෙස වැඩිහිටියන්/ ආබාධිත පුද්ගලයන්/ වැන්දඹුවන් ශක්තිමත් කිරීම. | 250 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය (සමාජ සවිබල ගැන්වීමේ ඒකකය)<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)<br><br>වැඩිහිටි ජාතික ලේකම් කාර්යාලය<br><br>ආබාධිත පුද්ගලයින් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය (NSPD) | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබු තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලදී. පසු විපරම් කිරීමෙන් පසුවද, අදාළ නියෝජිතායතනය ගොණු කරන ලද තොරතුරු ඉල්ලුම්පතට ප්‍රතිචාර දැක්වූයේ නැත.<br><br>මාර්ගගතව සපයා ඇති තොරතුරු ප්‍රගති තක්සේරුවක් සඳහා ප්‍රමාණවත් නොවූ බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "සීමිත" ලෙස වර්ගීකරණය කරන ලදී. | පොරොන්දුවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු අන්තර්ජාලයෙන් (ප්‍රගාමීව) ලබා ගත නොහැකි වූ අතර, තොරතුරු ඉල්ලුම්පතට ප්‍රතිචාර වශයෙන් පොරොන්දුව ක්‍රියාත්මක කරන නියෝජිතායතනයෙන් කිසිදු තොරතුරක් ලැබී නොමැත.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීමට තොරතුරු ප්‍රමාණවත් නොවූ බැවින්, එම පොරොන්දුවේ ප්‍රගතිය "හෙළිකර නැත" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 51:<br>කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන 10ක් ස්ථාපිත කිරීම. | මුල් වෙන් කිරීම-<br>රු. මිලියන 250<br><br>සංශෝධිත වෙන් කිරීම-<br>රු. මිලියන 190 | වාරිමාර්ග අමාත්‍යාංශය (MOI) | **උදාසීන**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 මාර්තු 12 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 21කට පසුව, නමුත් දින 28ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු බොහෝ පරිශ්‍රමයකින් (ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 21 කින් පසුව) ලබා ගත් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "උදාසීන" ලෙස වර්ගීකරණය කරන ලදී. | **සැළකිය යුතුයි**<br><br>ලද තොරතුරුවලට අනුව මෙම පොරොන්දුව සඳහා, කරන ලද මුල් වෙන්කිරීම වන රුපියල් මිලියන 250, රුපියල් මිලියන 190 දක්වා සංශෝධනය කර ඇත. ප්‍රගති වාර්තාව සහ ක්‍රියාකාරී සැලැස්මට අනුව කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන 11ක් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ. අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 166.96ක් සඳහා භාණ්ඩාගාරයට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර, එයින් රුපියල් මිලියන 91.105ක් ලැබී ඇත. අමාත්‍යාංශය විසින් එම ලැබුණු මුදල සම්පූර්ණයෙන්ම භාවිත කර ඇත.<br><br>පවතින තොරතුරුවලට අනුව, ලබාගෙන ඇති භෞතික ප්‍රගතිය 88% වන අතර මූල්‍ය ප්‍රගතිය 48% (රුපියල් මිලියන 91.105/ රුපියල් මිලියන 190) වේ.<br><br>පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය 68% වන බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය "සැලකිය යුතුයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 65: | රු. මිලියන | | **සාධනීය** | **දුර්වලයි** |

| | | | | |
|---|---|---|---|---|
| තරුණ කාන්තා ව්‍යවසායකයන් දිරි ගැන්වීම සඳහා ණය යෝජනා ක්‍රමය. | 250 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු, ඉල්ලීම ගොනු කළ දින සිට දින 14ක් ඇතුළත එනම් 2024 පෙබරවාරි 12 වැනි දින තොරතුරු ලැබී ඇත.<br><br>මූල්‍ය ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි තොරතුරු නියමිත වේලාවට ලබා දුන් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "සාධනීය" ලෙස වර්ගීකරණය කරන ලදී. | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය 2023 සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ 2024 ජනවාරි 19 වන විට සැබෑ මූල්‍ය ප්‍රගතිය සැපයූ නමුත් භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දුන්නේ නැත.<br><br>ලැබී ඇති තොරතුරුවලට අනුව, භාණ්ඩාගාරය විසින් 2023 දෙසැම්බර් 12 වන දින රුපියල් මිලියන 50ක් නිකුත් කර ඇත. මෙයින්, ප්‍රතිලාභීන් 20ක් ඉලක්ක කර ගනිමින් අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 5ක් ලබා දී ඇත. ප්‍රතිලාභීන් 103ක් ඉලක්ක කර ගනිමින් තවත් රුපියල් මිලියන 25.1ක් මුදා හැරීමට සැලසුම් කර ඇත.<br><br>අයවැය වර්ෂය තුළ වෙන් කළ රුපියල් මිලියන 250 න් රුපියල් මිලියන 5 ක් පමණක් වැය කර ඇති බැවින්, මූල්‍ය ප්‍රගතිය 2% කි.<br><br>ඉහත ප්‍රගතිය 33% ට වඩා අඩු බැවින් පොරොන්දුවේ ප්‍රගතිය "දුර්වලයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 10:<br>ආයෝජන හිතකර පරිසරය - යහපත් ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කිරීමට හැකිවන පරිදි, පිරිවැය, ක්‍රියාපටිපාටි හා කාලය අවම කිරීමට සහ විනිවිදභාවය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම. | රු. මිලියන 200 | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය (MOIP) | **සාධනීය**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබූ තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 පෙබරවාරි 27 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව, නමුත් දින 21ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි තොරතුරු නියමිත වේලාවට ලබා දුන් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "සාධනීය" ලෙස වර්ගීකරණය කරන ලදී. | **අර්ධ සම්පූර්ණයි**<br><br>ආයෝජන හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) සකස් කිරීම සඳහා 2023.08.29 සහ 2023.08.30 යන දිනවල වැඩමුළු සඳහා පාර්ශ්වකරුවන් සහභාගී වූ බව අමාත්‍යාංශය විසින් අන්තර්ජාලය හරහා ප්‍රකාශයට පත් කරන ලද තොරතුරු සඳහන් කරයි. ඉලක්කගත රුපියල් මිලියන 200 න් රුපියල් මිලියන 114.93 ක් වියදම් කර ඇති බව තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාර ලෙස දැන්වීය.<br><br>තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත්‍රයට ප්‍රතිචාර වශයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් සපයන ලද ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රගති වාර්තාවලට අනුව භෞතික ප්‍රගතියෙන් 72%ක් අත්කරගෙන ඇති අතර මූල්‍ය ප්‍රගතියෙන් 57%ක් අත්කරගෙන ඇත.<br><br>පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය 65% වන බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය "අර්ධ සම්පූර්ණයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 16: | රු. මිලියන | | **සාධනීය** | **අර්ධ සම්පූර්ණයි** |

| | | | | |
|---|---|---|---|---|
| කුරුඳු කර්මාන්තය සඳහා නව දෙපාර්තමේන්තුවක්. | 200 | කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br><br>කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව (DCD) | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබූ තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු, ඉල්ලීම ගොනු කළ දින සිට දින 14ක් ඇතුළත එනම් 2024 පෙබරවාරි 20 වැනි දින තොරතුරු ලැබී ඇත.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි තොරතුරු නියමිත වේලාවට ලබා දුන් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය “සාධනීය” ලෙස වර්ගීකරණය කරන ලදී. | අන්තර්ජාලය ඔස්සේ ප්‍රකාශයට පත් කරන ලද කැබිනට් තීරණවලට අනුව, 2023 අගෝස්තු 14 වන දින කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ජනාධිපති මාධ්‍ය අංශයට අනුව, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ජනක ලින්දාර මහතා, 2023 නොවැම්බර් 09 වැනි දින 'කුළුබඩු කවුන්සිලයේ' 19 වැනි වාර්ෂික මහා සභා රැස්වීමට ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහ කෘෂිකාර්මික හා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා සමඟ සහභාගී වී ඇත.<br><br>පහත ක්‍රියාකාරකම් 10 ඇතුළත්, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලද ගුණාත්මක තොරතුරු මත පදනම්ව මෙම පොරොන්දුවේ භෞතික ප්‍රගතිය තක්සේරු කරයි: (1) 2023 සැප්තැම්බර් 1 දින සිට කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා 2023 අගෝස්තු 14 දින කැබිනට් අනුමැතිය, (අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අංක 23/1501/601/050). (2) L.M.J.K. ලින්දාර මහතා, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ (සංවර්ධන), කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරන ලදී. නමුත් අධ්‍යක්ෂ ජනරාල්වරයා හැර වෙනත් කිසිදු නිලධාරියෙක් නව දෙපාර්තමේන්තුවට පත් කර නැත. (3) නව ආයතනික ව්‍යුහයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කරන ලදී. (4) පලොල්පිටිය කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ඇතුළුව තනතුරු 142ක් 2023 වසරේ බඳවා ගැනීමට අනුමැතිය හිමි විය. නමුත් 2023 වර්ෂයේදී කිසිම නිලධාරියෙක් නිසි පරිදි බඳවාගෙන නැත. (5) දැනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලුම භෞතික වත්කම් සමඟ ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරීමට යෝජිත කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර ඇත. (6) කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය සඳහා පෞද්ගලිකව අයත් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙන ඇත. (7) කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය සඳහා ලංසු සකස් කර ඉදිරිපත් කර ඇත. (8) කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු පනත සඳහා සංකල්ප පත්‍රිකාවක් 2023 අගෝස්තු මාසයේදී නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවන ලදී. (9) කුරුඳු කර්මාන්තය සඳහා දස වසරක මාර්ග |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සිතියමක් සකස් කිරීම මේ වන විට සිදුවෙමින් පවතී. (10) මෙම මුලපිරීම සම්බන්ධ වැඩමුළු දෙකක් දැනටමත් පවත්වා ඇති අතර, එක් වලංගු කිරීමේ වැඩමුළුවක් ද පවත්වා ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව 'Cinnamon Gate' ව්‍යාපෘතිය කුරුළු සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ඇති අතර, ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අදාළ ඉඩම කොන්ත්‍රාත්කරුවන් වෙත පවරා ඇත.<br><br>තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ලද ප්‍රතිචාරය සහ ජනාධිපති මාධ්‍ය අංශයෙන් (PMD) නිකුත් කළ මාධ්‍ය නිවේදන මත, කුරුළු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා ඇති බව තහවුරු වේ. ඉහත සඳහන් කළ ක්‍රියාකාරකම් 10 න්, ක්‍රියාකාරකම් 4, 7, 8 සහ 9 ක්‍රියාත්මක වෙමින් පවතී හෝ තවමත් ක්‍රියාත්මක කර නැත. නමුත්, 60%ක භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරමින් ක්‍රියාකාරකම් 6ක් සම්පූර්ණ කර ඇත.<br><br>පොරොන්දුවේ මූල්‍ය ප්‍රගතිය තක්සේරු කිරීමට තොරතුරු නොලැබිණි.<br><br>පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය 60% ක් වූ බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය "අර්ධ සම්පූර්ණයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 20:<br>ග්‍රාමීය පාසල්වල පහසුකම් වැඩි දියුණු කිරීම: පළාත් පාසල් 139 ක, ජාතික පාසල් 23 ක, සහ අවම පහසුකම් සහිත ග්‍රාමීය පාසල්වල සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම. | රු. මිලියන 200 | අධ්‍යාපන අමාත්‍යංශය (MOE) | **ආවෘත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලදී. පසු විපරම් කිරීමෙන් පසුවද, අදාළ නියෝජිතායතනය ගොණු කරන ලද තොරතුරු ඉල්ලුම්පතට ප්‍රතිචාර දැක්වූයේ නැත.<br><br>ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් සපයා නොතිබූ බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "ආවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | **හෙළිකර නැත**<br><br>පොරොන්දුවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු අන්තර්ජාලයෙන් (ප්‍රගාමීව) ලබා ගත නොහැකි වූ අතර, තොරතුරු ඉල්ලුම්පතට ප්‍රතිචාර වශයෙන් පොරොන්දුව ක්‍රියාත්මක කරන නියෝජිතායතනයෙන් කිසිදු තොරතුරක් ලැබී නොමැත.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීමට කිසිදු තොරතුරක් නොතිබූ බැවින්, එම පොරොන්දුවේ ප්‍රගතිය "හෙළිකර නැත" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 25: | රු. මිලියන | | **උදාසීන** | **සම්පූර්ණයි** |

| | | | | |
|---|---|---|---|---|
| නව වෛද්‍ය පීඨයක් | 200 | අධ්‍යාපන අමාත්‍යාංශය (MOE)<br><br>උසස් අධ්‍යාපන අංශය | පොරොන්දුවේ ප්‍රගතිය තක්සේරු කිරීමට අන්තර්ජාලයේ නිල වෙබ් අඩවි කිහිපයක ඇති තොරතුරු ප්‍රමාණවත් විය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර, එම දිනයෙන් දින 28කට පසුව 2024 මාර්තු 20 වැනි දින තොරතුරු ලැබී ඇත.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු බොහෝ පරිශ්‍රමයකින් (ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 21 කින් පසුව) ලබා ගත් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය “උදාසීන” ලෙස වර්ගීකරණය කරන ලදී. | 2023 මාර්තු 20 දින නිකුත් කර අන්තර්ජාලය හරහා ප්‍රකාශයට පත් කරන ලද, අතිවිශේෂ ගැසට් පත්‍ර අංක. 2324/12 අනුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පස්වන පීඨය ලෙස වෛද්‍ය පීඨය නිල වශයෙන් ගැසට් කර ඇත. අලුතින් ආරම්භ කරන ලද පීඨයට පීඨාධිපතිවරයකු පත් කිරීම තහවුරු කරමින් පීඨය සඳහා නිල වෙබ් අඩවියක් ද ආරම්භ කර ඇත.<br><br>තවද, පාර්ලිමේන්තු සභාවේ කටයුතු අතරතුර ලේඛනාදිය පිළිගැන්වීමේදී 2023 ජූනි 23 වැනි දින අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද නියමය, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සමග කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන අංශ පිහිටුවීම සම්බන්ධයෙන් (පාර්ලිමේන්තු විවාද. (2023) ලිපි ලේඛනාදිය පිළිගැන්වීම. හැන්සාඩ් 304 කාණ්ඩය, 8 වන කලාපය, පිටුව 6).<br><br>මීට අමතරව, 2023 මැයි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද සහ අන්තර්ජාලය හරහා ලබා ගත හැකි විශ්වවිද්‍යාල ප්‍රවේශ මාර්ගෝපදේශ 2022/2023, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 'ජීව විද්‍යා විෂය ධාරාව' යටතේ 'වෛද්‍ය' සඳහා සිසුන් බඳවා ගැනීමේ ලැයිස්තුවට ඇතුළත් කර ඇත.<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය, තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාර වශයෙන්, 2023 මාර්තු 20 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2324/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය එවා ඇති අතර, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පස්වන පීඨය ලෙස වෛද්‍ය පීඨය නිල වශයෙන් පිහිටුවීම එහි සඳහන් වේ<br><br>ඉහත ගුණාත්මක තොරතුරු මත පදනම්ව, පොරොන්දුවේ ප්‍රගතිය “සම්පූර්ණයි” ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 29: | රු. මිලියන | | සාධනීය | දුර්වලයි |

| | | | | |
|---|---|---|---|---|
| විද්‍යුත් ක්‍රමවේදය මඟින් ගෙවීම් කිරීම ප්‍රවර්ධනය - මුදල් ප්‍රදාන මෙන්ම සේවා ලබා ගැනීම සඳහා ගෙවීම් ඇතුළුව සියලුම රජයේ ගෙවීම් 2024.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත් ක්‍රමයට සිදු කිරීම අනිවාර්ය කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | 200 | තාක්ෂණ අමාත්‍යාංශය (MOT) | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබූ තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 පෙබරවාරි 21 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව, නමුත් දින 21ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි තොරතුරු නියමිත වේලාවට ලබා දුන් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය “සාධනීය” ලෙස වර්ගීකරණය කරන ලදී. | තාක්ෂණ අමාත්‍යාංශය තොරතුරු ඉල්ලුම්පතට ප්‍රතිචාර ලෙස, 2023 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ කර ඇති ක්‍රියාකාරකම් 11ක් දක්වා ඇත. ඒ අනුව, (1) නියමු වැඩසටහන සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවා ඇත. (2) ආයතන 14ක් තෝරාගෙන ඇත (3) LankaPay රජයට පසුපෙළ ප්‍රවේශය (backend access) සපයමින් පද්ධතිය සංවර්ධනය කරන ලදී, (4) ආයතන 14 ට පද්ධතිය සහ ඔවුන්ගේ වගකීම් පිළිබඳව දැනුවත් කරන ලදී, (5) අදාළ නිලධාරීන් පුහුණු කරන ලදී, (6) ආයතන 14 සමඟ ලේඛනගත මාර්ගෝපදේශ බෙදා දෙන ලදී, (7) ආයතන 14 සඳහා පරිශීලක පිවිසුම් නිර්මාණය කරන ලදී, (8) බැංකු 5ක් ඇතුල් කර ගන්නා ලදී (9) ගිවිසුම පාර්ශව අතර බෙදාහරින ලදී (පද්ධතියේ LankaPay සහ CBSL විසින් සිදු කරන ලද වෙනස්කම් හේතුවෙන් ගිවිසුම් සංශෝධනය කළ යුතුය), (10) මෙම පද්ධතිය දැන් ආයතන 14 සඳහා සජීවීව පවතී, සහ (11) ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව, අනෙකුත් බැංකු 2024 මාර්තු වන විට ඇතුළත් වනු ඇත.<br><br>ලැබුණු තොරතුරු තුළ සමස්ත අයවැය යෝජනාව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හෝ ප්‍රගති වාර්තාවක් ඇතුළත් නොවේ. නියමු වැඩසටහන පිළිබඳ ගුණාත්මක තොරතුරු පමණක් ඇතුළත් වේ<br><br>සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් ගෙනහැර දක්වන ලද තොරතුරු මත පදනම්ව, පොරොන්දුවේ ප්‍රගතිය "දුර්වලයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 53: | | | **සාධනීය** | **සැළකිය යුතුයි** |

| | | | | |
|---|---|---|---|---|
| පසු අස්වනු වගා හානි අඩු කිරීම හා ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම, තාක්‍ෂණය සහ අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | මුල් වෙන් කිරීම-<br>රු. මිලියන 150<br><br>සංශෝධිත වෙන් කිරීම-<br>රු. මිලියන 148 | කෘෂිකර්ම අමාත්‍යාංශය (MOA) | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබූ තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු, ඉල්ලීම ගොනු කළ දින සිට දින 14ක් ඇතුළත එනම් 2024 පෙබරවාරි 15 වැනි දින තොරතුරු ලැබී ඇත.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි තොරතුරු නියමිත වේලාවට ලබා දුන් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "සාධනීය" ලෙස වර්ගීකරණය කරන ලදී. | ලද තොරතුරුවලට අනුව මෙම පොරොන්දුව, ඉලක්කගත 100%ක භෞතික ප්‍රගතියට සාපේක්ෂව 88.5%ක සත්‍ය භෞතික ප්‍රගතියක් ලබා ඇත.<br><br>2023 ප්‍රගති වාර්තාවට අනුව මුල් ප්‍රතිපාදනය රුපියල් මිලියන 147.94ක් ලෙස සංශෝධනය කර ඇත. 70.11%ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගනිමින් රුපියල් මිලියන 103.71ක් වැය කර ඇත.<br>පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය 79.3% වන බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය "සැලකිය යුතුයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 64:<br>කෘෂිකර්මාන්තය තුළ තරුණයන් රඳවා ගැනීම දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය කරමින්, දැනට රැකියා විරහිත තරුණ තරුණියන් 240 දෙනෙකු තෝරාගෙන, ඔවුන් කෘෂි ව්‍යවසායකයන් ලෙස බල ගැන්වීම. | මුල් වෙන් කිරීම-<br>රු. මිලියන 120<br><br>සංශෝධිත වෙන් කිරීම-<br>රු. මිලියන 119 | කෘෂිකර්ම අමාත්‍යාංශය (MOA) | **සාධනීය**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබූ තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු, ඉල්ලීම ගොනු කළ දින සිට දින 14ක් ඇතුළත එනම් 2024 පෙබරවාරි 15 වැනි දින තොරතුරු ලැබී ඇත.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි තොරතුරු නියමිත වේලාවට ලබා දුන් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "සාධනීය" ලෙස වර්ගීකරණය කරන ලදී. | **සම්පූර්ණයි**<br><br>කෘෂිකර්ම අමාත්‍යාංශය 2023 දෙසැම්බර් වන විට භෞතික හා මූල්‍ය ඉලක්ක සහ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දී ඇත.<br><br>ලද තොරතුරු වලට අනුව, ඉලක්කගත 100%ක භෞතික ප්‍රගතියට සාපේක්ෂව 86.42% ක සත්‍ය භෞතික ප්‍රගතියක් ලබා ඇත.<br><br>තවද, ඉලක්කගත රුපියල් මිලියන 118.52 න් රුපියල් මිලියන 101.66 ක් වියදම් කර ඇති අතර, ඒ අනුව 86% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.<br><br>පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය 86% වන බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය "සම්පූර්ණයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 5:<br>විදේශ වෙළඳාම හා ආයෝජනය සම්බන්ධ නියෝජිතායතනය:<br>විදේශ වෙළඳාම සහ ආයෝජන සඳහා වූ නියෝජිතායතනය - ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන | රු. මිලියන 100 | N/A | **ආවෘත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබූ තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත් තුනක් 2024 ජනවාරි 31 දින ගොනු කරන ලදී. කෙසේ වෙතත්, පසු විපරම් කිරීමෙන් පසුව පවා, ජාතික අයවැය දෙපාර්තමේන්තුව (DNB) සහ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DFP)- හඳුනාගත් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. | **අයිතිකරුවෙකු නැත**<br><br>මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් 2024.01.10 දින ලිපියක් මගින් මෙම පොරොන්දුව ක්‍රියාත්මක කරන ආයතන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය (PS) සහ වෙළඳ අමාත්‍යාංශය හඳුනාගෙන ඇති අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2023.07.17 දිනැති ලිපියක් මඟින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස හඳුනාගෙන ඇත. ආයතන තුනටම තොරතුරු ඉල්ලුම්පත් ගොණු කර ලදී.<br><br>ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය මෙමෙ පොරොන්දුව තම බල සීමාව තුළ/ තමන් යටතේ නොවන බව පැහැදිලි කළේය. |

| | | | | |
|---|---|---|---|---|
| අධිකාරිය ආදිය වෙනුවට නව ආයතනයක් පිහිටුවීම. | | | ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් සපයා නොතිබූ බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "ආවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | 2024 පෙබරවාරි 14 වන දින වෙළඳ අමාත්‍යාංශය විසින් මෙම ඉල්ලීම ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කළේ එය ඔවුන්ගේ විෂය පථයට අයත් නොවන බව පවසමිනි. එදිනම, එම ඉල්ලුම්පත ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මුදල් අමාත්‍යාංශය වෙත මාරු කර යවන ලදී. 2024 මාර්තු 13 වන දින, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ඔවුන් කලින් නම් කරන ලද නියෝජිතායතන මෙම පොරොන්දුව සඳහා වගකිවයුතු නියෝජිතායතනය බව තහවුරු කරන ලදී.<br><br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් නියෝජිතායතනය විසින් පොරොන්දුව ඉටු කිරීම පිළිබඳව ඇති වගකීම ප්‍රතික්ශේප කිරීම නිසා මෙම පොරොන්දුව "අයිතිකරුවෙකු නැත" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 7: | | N/A | ආවෘත | අයිතිකරුවෙකු නැත |

| | | | | |
|---|---|---|---|---|
| ජාතික එලදායිතා කොමිෂන් සභාව - ආර්ථිකයේ සියලුම අංශ වල එලදායීතාවය වැඩිකිරීම වෙනුවෙන්. | රු. මිලියන 100 | | පොරොන්දුවේ ප්‍රගතිය තක්සේරු කිරීමට අන්තර්ජාලයේ නිල වෙබ් අඩවි කිහිපයක ඇති තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත් දෙකක් 2024 ජනවාරි 31 දින ගොනු කරන ලදී. කෙසේ වෙතත්, පසු විපරම් කිරීමෙන් පසුව පවා, ජාතික අයවැය දෙපාර්තමේන්තුව (DNB) සහ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DFP)- හඳුනාගත් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි.<br><br>ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් සපයා නොතිබූ බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "ආවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | 2023 අගෝස්තු 14 වැනි දින ජාතික එලදායිතා කොමිෂන් සභාවක් පිහිටුවීම පිළිබඳ කැබිනට් තීරණයක් ගන්නා ලදී. කොමිසමේ සංවිධාන ව්‍යුහය තීරණය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කිරීමට ගරු ජනාධිපතිතුමා කළ යෝජනාවට අනුමැතිය හිමි වී ඇත. ජනාධිපති ලේකම් කාර්යාලයේ මාධ්‍ය නිවේදනයකට අනුව, එලදායිතාව ඉහළ නැංවීම සඳහා ගෝලීය හොඳම භාවිතයන් ගවේෂණය කිරීම සඳහා විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවල සාමාජිකයින් ඇතුළු අන්තර් අමාත්‍යාංශ ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා රජය, ඕස්ට්‍රේලියානු එලදායිතා කොමිසම සමඟ සම්බන්ධ වී ඇත, ඒ අනුව 2023 අප්‍රේල් 27 වැනි දින ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධානත්වයෙන්, ඕස්ට්‍රේලියානු එලදායිතා කොමිසම ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම වෙනුවෙන් මාර්ගගත සැසියක් පවතවා ඇත.<br><br>රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් 2024.01.10 වන දින පොරොන්දුව සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය සහ වෙළඳ අමාත්‍යාංශය හඳුනා ගන්නා ලදී. ඉහත ආයතන දෙකටම තොරතුරු ඉල්ලුම්පත් ගොනු කරන ලද නමුත් වෙළඳ අමාත්‍යාංශය තොරතුරු ඉල්ලුම්පත, 2024 පෙබරවාරි 14 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයට මාරු කළ අතර, ජනාධිපති ලේකම් කාර්යාලය තොරතුරු ඉල්ලුම්පත මුදල් අමාත්‍යාංශයට එදිනම මාරු කළේ එය ඔවුන්ගේ විෂය පථයට අයත් නොවන බව පවසමිනි. 2024 මාර්තු 13 වන දින, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ඔවුන් කලින් නම් කරන ලද නියෝජිතායතන මෙම පොරොන්දුව සඳහා වගකිවයුතු නියෝජිතායතනය බව තහවුරු කරන ලදී.<br><br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් නියෝජිතායතනය විසින් පොරොන්දුව ඉටු කිරීම පිළිබඳව ඇති වගකීම ප්‍රතික්ෂේප කිරීම නිසා මෙම පොරොන්දුව "අයිතිකරුවෙකු නැත" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 23:<br>විශ්වවිද්‍යාලවල උපාධි සඳහා තත්ත්ව සහතික හා ප්‍රතීතන මණ්ඩලයක් - අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන | රු. මිලියන 100 | අධ්‍යාපන අමාත්‍යාංශය (MOE)<br><br>උසස් අධ්‍යාපන අංශය | **උදාසීන**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබු තොරතුරු ප්‍රමාණවත් නොවීය. | **දුර්වලයි**<br><br>2023 මාර්තු 27 වැනි දින කැබිනට් තීරණවලට අනුව, 2023 අප්‍රේල් 2 වැනි දින තත්ත්ව සහතික සහ ප්‍රතීතන කොමිෂන් සභාව (QAAC) පිහිටුවීමේ යෝජනාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. උසස් අධ්‍යාපන (තත්ත්ව සහතික |

| | | | | |
|---|---|---|---|---|
| සහිතව මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය | 2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 මාර්තු 11 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 21කට පසුව, නමුත් දින 28ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු බොහෝ පරිශ්‍රමයකින් (ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 21 කින් පසුව) ලබා ගත් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය “උදාසීන” ලෙස වර්ගීකරණය කරන ලදී. | ප්‍රතීතන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවසර දීම ද ඊට ඇතුළත් විය. නමුත් සැලසුම් කළ පරිදි පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැත. නීතිපති (AG) විසින් යෝජනා කරන ලද සංශෝධන සහ පාර්ශවකරුවන්ගේ සමාලෝචනය කිරීමෙන් පසුව, පනත් කෙටුම්පත තවදුරටත් සංශෝධන කිරීම අවශ්‍ය බව තීරණය විය. මෙම වෙනස්කම් සමඟ නව පිටපතක් නිර්මාණය කිරීමට නීති කෙටුම්පත් සම්පාදකයාට අධ්‍යාපන අමාත්‍යවරයා කළ යෝජනාවට කැබිනට් මණ්ඩලය එකඟ විය.<br><br>අධ්‍යාපන අමාත්‍යාංශයේ ලබාදුන් තොරතුරු වලට අනුව, 2022 අගෝස්තු 31 දින පත් කරන ලද තාක්ෂණික උපදේශක කමිටුව (TAC), 2023 පෙබරවාරි 10 වැනි දින වාර්තාවක් මඟින් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කළේය. 2023 අප්‍රේල් 4 වැනි දින අමාත්‍ය මණ්ඩල තීරණයක් මත පදනම්ව, 4 සිට 7 දක්වා වගන්ති හැර සංශෝධන පනත් කෙටුම්පතට ඇතුළත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. අනතුරුව, 2023 අප්‍රේල් 21 වැනි දින, කැබිනට් අනුමත සංශෝධන ඇතුළත් කරන ලෙස නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට උපදෙස් දෙන ලද අතර, අවසන් පනත් කෙටුම්පත නිෂ්කාශනය සඳහා 2023 ජූනි 22 දින නීතිපතිවරයා වෙත යොමු කරන ලදී. අද දක්වා, නීතිපතිවරයා විසින් ව්‍යවස්ථාපිත සහතිකය ලබා දී නොමැත (2024 මාර්තු 6 දිනැති ලිපියට අනුව).<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය තොරතුරු ඉල්ලුම්පතට එවූ පිළිතුරට අනුව, තත්ත්ව සහතිකය සඳහා වූ මෙම පොරොන්දුව ඉදිරියේදී, 2024 අයවැය කතාවේදී පිහිටුවීමට යෝජනා කළ ජාතික උසස් අධ්‍යාපන කවුන්සිලයේ (NHEC) විෂය පථයට අදාළ වේ. තවද, තත්ත්ව සහතික කිරීමේ මණ්ඩලයක් පිහිටුවීමේ මූල්‍ය හා භෞතික කාර්ය සාධන ඉලක්ක නියම කරනු ලබන්නේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව පමණි.<br><br>පනත් කෙටුම්පත තවමත් ප්‍රකාශයට පත් කර නොමැති අතර එය ස්ථාපිත කිරීම 2024 අයවැය වර්ෂයට කල් දමා ඇති බැවින් එය "දුර්වලයි" ලෙස වර්ගීකරණය කරන ලදී”. |
| 33: - | | ධීවර අමාත්‍යාංශය | **විවෘත** | **සැළකිය යුතුයි** |

| | | | | |
|---|---|---|---|---|
| මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම - දැනට ඇති මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවල ධාරිතාවය ඉහළ නැංවීම. | රු. මිලියන 100 | | 2023 සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ 2023.12.31 දිනට ප්‍රගති වාර්තාව ධීවර අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි වූ බැවින් තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු, ඉල්ලීම ගොනු කළ දින සිට දින 14ක් ඇතුළත එනම් 2024 පෙබරවාරි 19 වැනි දින තොරතුරු ලැබී ඇත.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු නිල වෙබ් අඩවිය ඔස්සේ ප්‍රගාමීව සපයා ඇති බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "විවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | ධීවර අමාත්‍යාංශය 2023 දෙසැම්බර් වන විට සැබෑ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දී ඇත. ලබා දී ඇති තොරතුරු අනුව 2023 දෙසැම්බර් වන විට ඉලක්කගත 100%ක භෞතික ප්‍රගතියට සාපේක්ෂව 60% ක සැබෑ භෞතික ප්‍රගතියක් ලබා ඇත.<br><br>තවද, ඉලක්කගත රුපියල් මිලියන 100න් රුපියල් මිලියන 81.53ක් වැය කර ඇත. මූල්‍ය ප්‍රගතිය 81.53% වන අතර, එයින් පෙන්නුම් කරන්නේ ව්‍යාපෘතියේ වියදම් 2023 දෙසැම්බර් වන විට සැලසුම් කළ අයවැයට වඩා මදක් අඩු බවයි.<br><br>පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය 70.54% වන බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය "සැලකිය යුතුයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 55: | | | **උදාසීන** | **සම්පූර්ණයි** |

| | | | | |
|---|---|---|---|---|
| දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම - සඳහා කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සහ නව තාක්ෂණයන් අනුගමනය කිරීම. | රු. මිලියන 100 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 අප්‍රේල් 1 වැනි දින ලැබී ඇත. තොරතුරු ලිපිය 2024 මාර්තු 21 දිනැති අතර, එය තොරතුරු ඉල්ලුම්පත ගොනු කළ දින සිට දින 28 කට පසුව ලැබී ඇත. අයවැය පොරොන්දුවේ මූලික අරමුණට සිදුවූ වෙනස්කම් මූල්‍ය ඉලක්ක/සත්‍ය අගයන් සහ සාක්ෂාත් කර ගත් භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු සවිස්තරාත්මක සපයන ලදී.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු බොහෝ පරිශ්‍රමයකින් (ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 21 කින් පසුව) ලබා ගත් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "උදාසීන" ලෙස වර්ගීකරණය කරන ලදී. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන්, තොරතුරු ඉල්ලීමට ලද ප්‍රතිචාරයට අනුව, ගොනුන් (bulls) 17 ක් ආනයනය කිරීම මූලික අරමුණ වූ නමුත් ලංසුකරුගේ ලේඛන පිරිවිතරයන්ට අනුකූල නොවීම නිසා මෙම සැලසුම අත්හැර දමා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, CAIS-කුණ්ඩසාලේහි උසස් තත්ත්වයේ ගැඹුරු ශීත කළ ශුක්‍රාණු නිෂ්පාදනය පවත්වාගෙන යාම සඳහා උපකරණ සහ යටිතල පහසුකම් මිලදී ගැනීමට දෙපාර්තමේන්තුව තීරණය කර ඇත.<br><br>ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අතිරේක අරමුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇති බව අර්ධ වාර්ශික ඇගයීමේදී හෙළි විය. 2023 ජූනි මස වන විට ගොන් මඩුව (bull shed) ප්‍රතිසංස්කරණය කිරීම, ගොන් ගවයන් (stud bulls) සඳහා තණබිම් සංවර්ධනය කිරීම, ශුක්‍රාණු බෙදා හැරීමේ වාහන 02ක් අත්පත් කර ගැනීම සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම යන කටයුතු මූල්‍යමය බාධාවන් නිසා නතර විය.<br><br>ස්වයංක්‍රීය ක්ලේව් (autoclave), පිරවුම් මුද්‍රා මුද්‍රණ යන්ත්‍රයක් (a filling sealing printing machine), වර්ණාවලි ඡායාමාපකයක් (a spectrophotometer), ලීටර් 800ක ශුක්‍රාණු ගබඩා ටැංකියක්, ව්‍යායාම ප්‍රදේශ සංවර්ධනය, බුෂ් කටර් 02 සහ බුල් කාපට් 25 ක් ඇතුළු විවිධ ක්‍රියාකාරකම් සඳහා 80.1% ක සැබෑ මූල්‍ය ප්‍රගතියක් ලබා ගනිමින් වෙන් කළ රුපියල් මිලියන 100 න් රුපියල් මිලියන 80.1 ක් වැය කර ඇති බව තොරතුරු අයදුම්පතට පිළිතුරු ලෙස දෙපාර්තමේන්තුව දැන්වීය.<br><br>තවද 80%ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.<br><br>මේ අනුව සමස්ත ප්‍රගතිය 80% කි.<br><br>පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය 86% වන බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය "සම්පූර්ණයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 56: | | පරිසර අමාත්‍යාංශය | ආවෘත | හෙළිකර නැත |

| | | | | |
|---|---|---|---|---|
| දේශගුණික වෙනස්වීම් පිළිබඳව ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් (IUCC)- දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්ෂේත්‍රවල දැනුම වැඩි දියුණු කිරීම, අත්දැකීම් බෙදාගැනීම, අධ්‍යාපනය, පුහුණුව, හැකියාවන් ගොඩනැගීම, වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා IUCC පිහිටුවීම. | රු. මිලියන 100 | | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය මෙම පොරොන්දුවට අදාළ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස හඳුනා ගැනීමෙන් පසුව තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතක් ගොණු කරන ලදී.<br><br>කෙසේ වෙතත්, මෙය ඔවුන්ගේ විෂය පථයට අයත් නොවන බවත්, එය පරිසර අමාත්‍යාංශය යටතේ පවතින බවත්, 2024 මාර්තු 19 දිනැති (එය ලැබුණේ 2024 මාර්තු 25 වන දින), එනම් ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 28 කට පසුව, අධ්‍යාපන අමාත්‍යාංශය ලිපියකින් අපට දන්වා සිටියේය.<br><br>ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් සපයා නොතිබූ බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "ආවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | ‘රජයේ නිල පුවත් ද්වාරය’ට අනුව, 2023 දෙසැම්බර් 3 වන දින ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් ජාත්‍යන්තර දේශගුණික වෙනස්වීම් පිළිබඳව ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් නිල වශයෙන් ආරම්භ කරන ලදී. එම ලිපියේ සඳහන් අයුරින්, විශ්වවිද්‍යාලය සඳහා කොත්මලේ ජලාශයට ඉහළින් අක්කර 600 ක භූමි ප්‍රමාණයක් වෙන් කර ඇත.<br><br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින්, අධ්‍යාපන අමාත්‍යාංශය මෙම පොරොන්දුව සඳහාවූ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස හඳුනා ගැනීමෙන් පසුව අමාත්‍යාංශය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතක් ගොණු කරන ලදී. කෙසේ වෙතත්, මෙය ඔවුන්ගේ විෂය පථයට අයත් නොවන බවත්, එය පරිසර අමාත්‍යාංශය යටතේ පවතින බවත්, 2024 මාර්තු 19 දිනැති (එය ලැබුණේ 2024 මාර්තු 25 වන දින), එනම් ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 28 කට පසුව, අධ්‍යාපන අමාත්‍යාංශය ලිපියකින් අපට දන්වා සිටියේය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීමට කිසිදු තොරතුරක් නොතිබූ බැවින්, එම පොරොන්දුවේ ප්‍රගතිය “හෙළිකර නැත” ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 59:<br>සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ නව රසායනාගාරයක් - මධ්‍යසාර නිෂ්පාදනවලට අදාළව පරීක්ෂණ කටයුතු කිරීම තුළින් මධ්‍යසාර නිෂ්පාදනවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සහ ප්‍රමිතීන් සකස් කිරීම සඳහා රසායනාගාරයක්. | රු. මිලියන 100 | සුරාබදු දෙපාර්තමේන්තුව (DE) | **උදාසීන**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 මාර්තු 12 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 21කට පසුව, නමුත් දින 28ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු බොහෝ පරිශ්‍රමයකින් (ඉල්ලුම්පත ගොණු කිරීමෙන් දින 21 කින් පසුව) ලබා ගත් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය “උදාසීන” ලෙස වර්ගීකරණය කරන ලදී. | **අර්ධ සම්පූර්ණයි**<br><br>සුරාබදු දෙපාර්තමේන්තුව 2023 දෙසැම්බර් වන විට සැබෑ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දී ඇත.<br><br>ලද තොරතුරු වලට අනුව, පොරොන්දුව තුළ කාර්යයන් 10 ක් ඇතුළත් වන අතර, ප්‍රගති වාර්තාව මෙම කාර්යයන්හි භෞතික ප්‍රගතිය ගෙනහැර දක්වයි. මෙම තොරතුරු වලට අනුව, 2023 දෙසැම්බර් වන විට 75% ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.<br><br>තවද, 1.48%ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරමින් 'කාර්ය 8: විද්‍යාගාර උපකරණ, වීදුරු භාණ්ඩ, ගෘහභාණ්ඩ සහ අනෙකුත් අවශ්‍යතා' සඳහා යොදාගෙන ඇති මුළු මුදල රුපියල් මිලියන 100 න් රුපියල් මිලියන 1.48 ක් පමණි.<br><br>මේ අනුව සමස්ත ප්‍රගතිය 38.24% කි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය 38.24% ක් වූ බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය "අර්ධ සම්පූර්ණයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 60:<br>මාර්ග නඩත්තු අරමුදලක් ස්ථාපනය කිරීම - වාර්ෂිකව සියලු වර්ගවල මාර්ග නඩත්තු කටයුතු සඳහා. | රු. මිලියන 100 | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය (MOTH)<br><br>මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) | **සාධනීය**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබූ තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 පෙබරවාරි 22 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව, නමුත් දින 21ක් ඇතුළත තොරතුරු ලැබිණි. සපයන ලද තොරතුරුවල පොරොන්දුව සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් අඩංගු විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි තොරතුරු නියමිත වේලාවට ලබා දුන් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය “සාධනීය” ලෙස වර්ගීකරණය කරන ලදී. | **සම්පූර්ණයි**<br>‘මාර්ග නඩත්තු අරමුදල පිහිටුවීම’ පිළිබඳ කැබිනට් තීරණය, 2023 මාර්තු 27 වැනිදා ගන්නා ලදී. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයාගේ යෝජනාවකට අනුව පාර්ලිමේන්තු පනතක් මගින් අරමුදල පිහිටුවීමට කැබිනට් අනුමැතිය හිමි විය.<br><br>මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කාර්තුමය භෞතික ඉලක්ක සහ 2023 දෙසැම්බර් වන විට සැබෑ ප්‍රගතිය සමඟ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් සපයන ලදී. 75% භෞතික ප්‍රගතියක් ඉලක්ක කර, 2023 දෙසැම්බර් වන විට එය සාක්ෂාත් කරගෙන ඇති බැවින්, පොරොන්දුවේ භෞතික ප්‍රගතිය 100%කි. මීට අමතරව, 2023 අගෝස්තු 28 දින, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ආදායම් බලපත්‍රවල මාර්ග නඩත්තු බද්ද සඳහා සංශෝධිත කෙටුම්පතක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.<br><br>කෙසේ වෙතත්, සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව, 2023 වසර සඳහා මූල්‍ය ඉලක්ක හෝ වියදම් නොතිබූ අතර, එබැවින් 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය අදාළ නොවේ.<br><br>මේ අනුව, සමස්ත ප්‍රගතිය 100% කි.<br><br>පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය 100% වන බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය “සම්පූර්ණයි” ලෙස වර්ගීකරණය කරන ලදී.<br><br>සටහන: සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ප්‍රගතියේ ඉතිරි 25% සම්පූර්ණ කරන්නේ කවදාද යන්න හෝ රුපියල් මිලියන 100 භාවිතා කරන්නේ කෙසේද යන්න නිශ්චිතව දක්වා නැත. එපමනක් නොව, 2023 අයවැය කථාව මෙය බහු-වසරක ව්‍යාපෘතියක්/ මුලපිරීමක් ලෙස නම් කර නැත. |
| 68: | | | **සාධනීය** | **දුර්වලයි** |

| | | | | |
|---|---|---|---|---|
| රැඳවියන් සඳහා සනීපාරක්ෂක පහසුකම් | අයවැය කථාවෙන් වෙන් කිරීම - රු. මිලියන 100<br><br>2023 අයවැය ඇස්තමේන්තු වලින් වෙන් කිරීම- රු. මිලියන 200<br><br>මුළු ප්‍රතිපාදනය- රු. මිලියන 300 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව (DP) | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 පෙබරවාරි 21 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව, නමුත් දින 21ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි තොරතුරු නියමිත වේලාවට ලබා දුන් බැවින්, පොරොන්දුවේ විවෘතභාවය “සාධනීය” ලෙස වර්ගීකරණය කරන ලදී. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව, රැඳවියන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා 2023 අයවැය කතාවෙන් රුපියල් මිලියන 100ක් හා ‘අයවැය ශීර්ෂය 232-1-01’ යටතේ රුපියල් මිලියන 200ක් වෙන් කරන ලදී.<br><br>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රගති වාර්තාව මගින් රුපියල් මිලියන 94.5 ක් වටිනා ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය ආවරණය කරයි (බෙදා දුන් මුදල). මෙයින් රුපියල් මිලියන 86.7ක් වැය කර ඇත. 2023 දෙසැම්බර් වන විට මූල්‍ය ප්‍රගතිය 29% (රු. මිලියන 86.7 / රු. මිලියන 300) වේ.<br><br>සමස්ත අයවැය යෝජනාවේ භෞතික ප්‍රගතිය තක්සේරු කිරීමට ලැබුණු තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>ලද තොරතුරු මත පදනම්ව, යෝජනාවේ සමස්ත ප්‍රගතිය 29% කි.<br>ඉහත ප්‍රගතිය 33% ට වඩා අඩු බැවින් පොරොන්දුවේ ප්‍රගතිය “දුර්වලයි” ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 22:<br>වෛද්‍යවරුන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා - පේරාදෙණිය, රුහුණ හා යාපනය යන විශ්වවිද්‍යාලයන්හි වෛද්‍යවරුන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් හඳුන්වාදීම. | රු. මිලියන 60 | අධ්‍යාපන අමාත්‍යාංශය (MOE)<br><br>උසස් අධ්‍යාපන අංශය | **ආවෘත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළ නොතිබුණි.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලදී. පසු විපරම් කිරීමෙන් පසුවද, අදාළ නියෝජිතායතනය ගොණු කරන ලද තොරතුරු ඉල්ලුම්පතට ප්‍රතිචාර දැක්වූයේ නැත.<br><br>ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් සපයා නොතිබූ බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "ආවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | **හෙළිකර නැත**<br><br>කිසිදු තොරතුරක් ප්‍රගාමීව නිල වෙබ් අඩවිය තුළ හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාර ලෙස නියෝජිතායතනයෙන් ලැබී නැත.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීමට කිසිදු තොරතුරක් නොතිබූ බැවින්, එම පොරොන්දුවේ ප්‍රගතිය “හෙළිකර නැත” ලෙස වර්ගීකරණය කරන ලදී. |

**ප්‍රතිපත්ති යෝජනා**

| අයවැය ඡේද අංකය සහ යෝජනාව | රජයේ නියෝජිතායතනය | විවෘතභාවය | ප්‍රගතිය |
|---|---|---|---|
| 30:<br><br>දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීම. | තාක්ෂණ අමාත්‍යාංශය (MOT) | **විවෘත**<br><br>පොරොන්දුවේ ප්‍රගතිය තක්සේරු කිරීමට අදාළ තොරතුරු ප්‍රගාමීව නිල වෙබ් අඩවි හරහා ලබා ගත හැකි විය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2024 පෙබරවාරි 21 වන දින ලැබිණි. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව, නමුත් දින 21ක් ඇතුළත තොරතුරු ලැබිණි.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු නිල වෙබ් අඩවිය ඔස්සේ ප්‍රගාමීව සපයා ඇති බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "විවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | **සම්පූර්ණයි**<br><br>දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම පිළිබඳව (පනතේ V කොටස) සඳහන්, 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය අංක 2341/59 (2023 ජූලි 21 දින), යන ලේඛන අන්තර්ජාලයේ නිල වෙබ් අඩවි වල ඇත. පනත මඟින් දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සලසා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ ව්‍යවස්ථාව පිළිබඳ විධිවිධාන ඇතුළත් වේ.<br><br>2024 පෙබරවාරි 21 දින තාක්ෂණ අමාත්‍යාංශයෙන්, තොරතුරු ඉල්ලුම්පතට ලැබුණු පිළිතුරට අනුව, එහි පාලන අධිකාරිය පිහිටුවීම සනිටුහන් කරමින් 2023 අගෝස්තු 11 දින දත්ත ආරක්ෂණ අධිකාරිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ඇත.<br><br>අධිකාරියේ මෙහෙයුම් අධීක්ෂණය කිරීමේ වගකීම පැවරුණු වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයකු 2023 නොවැම්බර් 9 වැනි දින පත් කරන ලදී. තවද, දත්ත ආරක්ෂණ පනතට අනුකූලව නියාමන කටයුතු සම්බන්ධයෙන් කටයුතු ආරම්භ කර ඇත.<br><br>2022 අංක 9 දරන දත්ත ආරක්ෂණ පනත සහ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය අංක 2341/59 නිල වෙබ් අඩවි වල ඇති බැවින්, පොරොන්දුවේ ප්‍රගතිය “සම්පූර්ණයි” ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 43:<br><br>නව මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම් පනත. | N/A | **ආවෘත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබූ තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතක් 2024 ජනවාරි 31 දින ගොනු කරන ලදී. කෙසේ වෙතත්, පසු විපරම් කිරීමෙන් පසුව පවා, ජාතික අයවැය දෙපාර්තමේන්තුව (DNB) සහ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (DFP)- හඳුනාගත් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි.<br><br>ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් සපයා නොතිබූ බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "ආවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | **අයිතිකරුවෙකු නැත**<br><br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2023 ජූලි 27 දිනැති ලිපියක් මගින් මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී; කෙසේ වෙතත්, 2024 පෙබරවාරි 28 වන දින, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, මෙම පොරොන්දුව සඳහා ඔවුන් වගකිවයුතු නියෝජිතායතනය නොවන බව පවසමින් එම ඉල්ලීම නැවත මුදල් අමාත්‍යාංශය වෙත මාරු කරන ලදී. පසුව මුදල් අමාත්‍යාංශය විසින් මෙම ඉල්ලීම 2024 මාර්තු 5 වැනි දින රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත හරවා යවනු ලැබේ.<br><br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් නියෝජිතායතනය විසින් පොරොන්දුව ඉටු කිරීම පිළිබඳව ඇති |

| | | | |
|---|---|---|---|
| | | | වගකීම ප්‍රතික්ශේප කිරීම නිසා මෙම පොරොන්දුව "අයිතිකරුවෙකු නැත" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| 44:<br><br>ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරියක් ස්ථාපනය කිරීම. | ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) | **විවෘත**<br><br>පොරොන්දුවේ ප්‍රගතිය තක්සේරු කිරීමට අදාළ තොරතුරු ප්‍රගාමීව නිල වෙබ් අඩවි හරහා ලබා ගත හැකි විය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු, ඉල්ලීම ගොනු කළ දින සිට දින 14ක් ඇතුළත එනම් 2024 පෙබරවාරි 15 වැනි දින තොරතුරු ලැබී ඇත.<br><br>එලෙස ලද තොරතුරු, ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් විය.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු නිල වෙබ් අඩවිය ඔස්සේ ප්‍රගාමීව සපයා ඇති බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "විවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | **අර්ධ සම්පූර්ණයි**<br><br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2023 ඔක්තෝම්බර් 30 වැනි දින ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කර 2024 ජනවාරි 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ක්ෂුද්‍ර මූල්‍ය ණය නියාමන අධිකාරී පනත් කෙටුම්පත (අංක 234) තවමත් සම්මත වී නොමැත.<br><br>පුද්ගලයින් හත් දෙනෙකු සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TISL) විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට (SC SD 08/2024, 09/2024, 11/2024, 14/2024, 15/2024, 16/2024 සහ 17/2024 ) පෙත්සමක් ඉදිරිපත් කරන ලදී. මෙම පනත් කෙටුම්පත ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන්නන්ගේ සූරාකෑමේ ක්‍රියාවන් ඵලදායී ලෙස නියාමනය කිරීමට අපොහොසත් වන අතර සාධාරණත්වය, සමානුපාතිකත්වය, ස්වාභාවික යුක්තිය, බලතල බෙදීම සහ නෛතික සහතිකය යන ප්‍රමිතීන්ට නොගැලපෙන අතර එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 වගන්ති සමඟ ඒකාබද්ධව 83 ව්‍යවස්ථාව උල්ලංඝනය කරයි .<br><br>2024 පෙබරවාරි 20 වන දින ගරු කථානායකවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව ප්‍රකාශ කරන ලදී. මෙම ගැටලු විසඳීම සඳහා, සමහර වගන්ති වලට පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයක් අවශ්‍ය වන අතර තවත් ඒවාට විශේෂ බහුතරයක් සහ ජනමත විචාරණයක් හරහා ජනතාවගේ අනුමැතිය අවශ්‍ය වේ. අධිකරණය පෙන්වා දුන් නිර්දේශ අනුව පනත් කෙටුම්පත සංශෝධනය කිරීමෙන් මෙම ගැටලු විසඳාගත හැකි බව අධිකරණය පහදා දී ඇත.<br><br>අනතුරුව, පාර්ලිමේන්තුවේ රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාව විසින් කැඳවන ලද බහු පාර්ශ්වකරුවන්ගේ උපදේශනවලට අනුව, මුදල් අමාත්‍යාංශය විසින් පනත් කෙටුම්පත එහි මුල් අරමුණු ඵලදායි ලෙස ආමන්ත්‍රණය කිරීමට ඇති නොහැකියාව හේතුවෙන් නැවත කෙටුම්පත් කිරීම සඳහා එය ඉල්ලා අස්කර ගැනීමට තීරණය කළේය.<br><br>ක්ෂුද්‍ර මූල්‍ය ණය නියාමන අධිකාරී පනත් කෙටුම්පත අන්තර්ජාලය හරහා ප්‍රකාශයට පත් කර ඇති නමුත් ව්‍යවස්ථාපිත ගැටළු හේතුවෙන් ඉදිරියට යාමට නොහැකි වූ බැවින්, යෝජනාවේ ප්‍රගතිය "අර්ධ සම්පූර්ණයි" ලෙස වර්ගීකරණය කරන ලදී. |
| | | **ආවෘත** | **හෙළිකර නැත** |

| | | | |
|---|---|---|---|
| 11:<br><br>නව කම්කරු ප්‍රතිපත්ති | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා අන්තර්ජාලය තුළ තිබූ තොරතුරු ප්‍රමාණවත් නොවීය.<br><br>2024 ජනවාරි 31 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලදී. පසු විපරම් කිරීමෙන් පසුවද, අදාළ නියෝජිතායතනය ගොණු කරන ලද තොරතුරු ඉල්ලුම්පතට ප්‍රතිචාර දැක්වූයේ නැත.<br><br>ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් සපයා නොතිබූ බැවින්, පොරොන්දුවේ විවෘතභාවය "ආවෘත" ලෙස වර්ගීකරණය කරන ලදී. | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් 2023 මැයි 16 වැනි දින ශ්‍රී ලංකාවේ කම්කරු නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ යෙදවුම් සඳහා කැඳවීමක් ප්‍රකාශයට පත් කරන ලද අතර, මෙම ප්‍රතිසංස්කරණ සඳහා තම අදහස් ඉදිරිපත් කරන ලෙස සියලුම පාර්ශ්වකරුවන්ට සහ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ආරාධනා කළේය. ඉහත සඳහන් කළ කරුණු සඳහා අමාත්‍යාංශය විසින් මහජන සැසි ද පවත්වා තිබුණි.<br><br>පොරොන්දුවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නිල වෙබ් අඩවි වල ප්‍රගාමීව නොතිබූ අතර, තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ක්‍රියාත්මක කරන ආයතනයෙන් කිසිදු තොරතුරක් ලැබී නොමැත.<br><br>ප්‍රගතිය තක්සේරු කිරීමට කිසිදු තොරතුරක් නොතිබූ බැවින්, එම පොරොන්දුවේ ප්‍රගතිය “හෙළිකර නැත” ලෙස වර්ගීකරණය කරන ලදී. |


## වගකීම්හරණය

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු රජයේ වාර්තා, නිල ප්‍රකාශන, මහජන වාර්තා සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම් ඔස්සේ ලැබෙන තොරතුරු ඇසුරින් සම්පාදනය කර ඇත. මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු වෙරිටේ රිසර්ච් ආයතනයේ හෝ එහි සාමාජිකයින්ගේ හෝ පෞද්ගලික අදහස් හෝ මතය පිළිබිඹු නොකරයි. වේදිකාවේ ඇතුළත් තොරතුරුවල ප්‍රතිඵලයක් ලෙස සිදුවිය හැකි හෝ එසේ වූ බවට කියැවෙන කිසිදු අලාභයකට හෝ කීර්ති නාමයට හානි කිරීම ඇතුළුව කිසියම් අලාභයක් හෝ හානියක් සඳහා වෙරිටේ රිසර්ච් ආයතනය කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ.

මෙම වේදිකාවේ පළ කර ඇති තොරතුරු විශ්වාසදායක ප්‍රභවයන්ගෙන් ලබාගෙන ඇති බව සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර, තොරතුරුවල ඇති කිසිදු දෝෂයකට, මගහැරීමකට හෝ එම තොරතුරු භාවිතයෙන් ලබාගත් ප්‍රතිඵල සඳහා හෝ වෙරිටේ රිසර්ච් සහ Home - Public Finance Sri Lanka Dashboards | Budget Promisesකණ්ඩායමෙහි සාමාජිකයින් වගකිව යුතු නොවේ. වෙරිටේ රිසර්ච් ආයතනයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව මෙම වේදිකාවේ අන්තර්ගතයන් වෙනස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම, සම්ප්‍රේෂණය කිරීම, හුවමාරු කිරීම, විකිණීම, පිටපත් කිරීම, ව්‍යුත්පන්න කෘති නිර්මාණය කිරීම, බෙදා හැරීම, නැවත පළ කිරීම, රඟ දැක්වීම, ප්‍රදර්ශනය කිරීම සහ කිසිදු ආකාරයකින් වාණිජමය වශයෙන් භාවිතා කිරීම සඳහා පරිශීලකයින්ට අවසර නොමැත.

එමෙන්ම, වෙරිටේ රිසර්ච්හි පූර්ව අවසරය ඇතිව හෝ නැතිව, පූර්වයෙන් ලබාගත් තොරතුරක් පසුකාලීනව භාවිතා කිරීමෙන් උද්ගතවන ප්‍රතිඵල සඳහා Budget Promises ඩැශ්බෝඩය වගකිව යුතු නොවේ.

Budget Promises ඩැශ්බෝඩය කිසිදු දේශපාලන පක්ෂයක් සහ / හෝ දේශපාලනික වශයෙන් අභිප්‍රේරිත සංවිධානයක් වෙත සහය දැක්වීම, අනුමත කිරීම, නියෝජනය කිරීම සහ ඒ සමඟ සම්බන්ධ වීම ආදිය සඳහා කටයුතු නොකරයි. විශ්ලේෂණ සඳහා භාවිතා කෙරෙන දර්ශක හුදෙක් කාර්ය සාධනයේ සංඛ්‍යානමය අනුමානයන් පමණකි.

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු පරිශීලකයින් දැනුවත් කිරීම සඳහා නොමිලයේ සපයනු ලැබේ. එම තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වෙරිටේ රිසර්ච් හෝ Budget Promises ඩැශ්බෝඩය කණ්ඩායමේ සාමාජිකයින් සහ කිසියම් පරිශීලකයෙකු අතර එකඟතාවයක් හෝ අවබෝධතාවක් නොපවතී.

මෙම වේදිකාව, දත්ත මගින් ප්‍රදර්ශනය කෙරෙන ප්‍රවණතා දැක්වීමට සහ ඒවා පිළිබිඹු කිරීමට Budget Promises ඩැශ්බෝඩය විසින් සකස් කරන ලද ස්වාධීන විශ්ලේෂණ ලිපිවලින් සමන්විත වේ. එවැනි විශ්ලේෂණ ලිපි පිටපත් කිරීම වෙරිටේ රිසර්ච් හි පූර්ව අවසරය ඇතිව සිදු විය යුතුය.